චක්‍රලේඛ අංක: 74

අපේ අංකය:සං/ප්‍රති/01

චක්‍රලේඛ අංක 74

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,

අංක.70, පාර්ලිමේන්තු පාර,

පැලවත්ත, බත්තරමුල්ල.

2015.05.13 වෙනි දින.

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත.

**තේ නැවත වගාව සහ අලුත් වගාව යටතේ ගෙවනු ලබන සහනාධාර මුදල වැඩිකිරීම**

තේ නැවත වගාව සහ අලුත් වගාව යටතේ ගෙවනු ලබන සහනාධාර මුදල 2015.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි පහත සඳහන් ආකාරයට වැඩිකරනු ලැබ ඇත.

ඉහත වගා ක්‍රම වලට අදාලව 2015.01.01 දින සිට වැඩිකරන ලද සහනාධාර මුදල අනුව ගෙවීම් සකස් කලයුතුය. එහෙත් 2015.01.01 දිනට පෙර සිදුකල කටයුතු වෙනුවෙන් සකස්කර ඇති ගෙවීම් ඒ ආකාරයටම ක්‍රියාත්මක කලයුතු අතර 2015.01.01 දිනට පසුව සිදුකරන ක්ෂේත්‍ර කටයුතු සඳහා පමණක් සංශෝධිත සහනාධාර මුදල අනුව ගෙවීම් සකස් කලයුතු බව අවධාරණය කරමි.

1. **තේ නැවත වගාව.**

පස සාරවත් කිරීම සහිතව තේ නැවත වගාව සඳහා දැනට ගෙවනු ලබන සහනාධාර මුදල සියලුම තේ වගා කලාප සඳහා හෙක්ටයාරයකට රු.500,000/- ක් වන පරිදි වැඩිකර ඇති අතර එම මුදල පහත දැක්වෙන ආකාරයට ගෙවීමට කටයුතු කලයුතුය.

| වාරිකය | හෙක්ටයාර් 1 ක් සඳහා රුපි. |
|---|---|
| 1. බිම් සැකසීම | 130,000/- |
| 2. පස සාරවත් කිරීම -1 | 50,000/- |
| 3. පස සාරවත් කිරීම -11 | 200,000/- |
| 4. තේ වගාකිරීම | 70,000/- |
| 5. වසරක් තුල නඩත්තුව | 50,000/- |
| එකතුව | 500,000/- |

පස සාරවත් කිරීම සහිතව තේ නැවත වගාව යටතේ එක් ඉඩම් හිමියෙකුට වසරකට අවසර පත්‍ර නිකුත් කරන උපරිම බිම් ප්‍රමාණය හෙක්ටයාර් 2 ක්වේ.

2. <u>තේ අලුත්වගාව.</u>

කේෂ්ත්‍ර පරීක්ෂණවල නිර්දේශය පදනම් කරගෙන පහත සඳහන් පරිදි පස සාරවත් කිරීම සහිතව හා පස සාරවත් කිරීමෙන් තොරව තේ අලුත් වගාව යටතේ අවසර පත්‍ර නිකුත් කිරීමට කටයුතු කලහැකිය.

පස සාරවත්කිරීම සහිතව හෝ පස සාරවත් කිරීමෙන් තොරව අලුත් වගාව යටතේ එක් ඉඩම් හිමියෙකුට වසරකට අවසර පත්‍ර නිකුත් කරනු ලබන උපරිම බිම් ප්‍රමාණය හෙක්ටයාර් 0.4047 (අක්. 01)කට සීමා කෙරේ.

(අ) <u>පස සාවරත් කිරීම සහිතව - තේ අලුතින් වගාකිරීම.</u>

පස සාරවත් කිරීම සහිතව තේ අලුත්වගාව සඳහා ගෙවනු ලබන සහනාධාර මුදල හෙක්ටයාරයකට රුපි.400,000/- වන පරිදි සංශෝධනය කර ඇති අතර මුදල පහත පරිදි ගෙවීමට කටයුතු කලයුතුය.

| වාරිකය | හෙක්ටයාර් 1 ක් සඳහා රුපි. |
|---|---|
| 1. බිම් සැකසීම | 110,000/- |
| 2. පස සාරවත් කිරීම -1 | 40,000/- |
| 3. පස සාරවත් කිරීම -11 | 160,000/- |
| 4. තේ වගාකිරීම | 50,000/- |
| 5. වසරක් තුල නඩත්තුව | 40,000/- |
| එකතුව | 400,000/- |

(ආ) <u>පස සාරවත් කිරීමෙන් තොරව තේ අලුතින් වගා කිරීම.</u>

මෙම අවසර පත්‍ර සඳහා ගෙවීම් කිරීමේදී පස සාරවත් කිරීම රහිතව පහත සඳහන් පරිදි හෙක්ටයාරයකට රුපි.310,000/-ක් වනසේ ගෙවීමට කටයුතු කලයුතුය.

| වාරිකය | හෙක්ටයාර් 1 ක් සඳහා රුපි. |
|---|---|
| 1. බිම් සැකසීම | 110,000/- |
| 2. තේ වගා කිරීම | 160,000/- |
| 3. වසරක් තුල නඩත්තුව | 40,000/- |
| එකතුව | 310,000/- |

පසු සාරවත් කිරීමෙන් තොරව අලුත්වගාව යටතේ ඇති අනෙකුත් කොන්දේසි චක්‍රලේඛ අංක 69 පරිදි ඒ ආකාරයෙන්ම බලපැවැත්වේ.

මෙම චක්‍රලේඛය ලද බවත් ඒ අනුව ක්‍රියාකරන බවත් සනාථ කලයුතුය. මේ පිළිබඳව ඔබගේ සියලුම කාර්යමණ්ඩලය දැනුවත් කලයුතු අතර දැන්වීමේ පුවරුවේ දැනවීමක් ප්‍රදර්ශණය කිරීමට කටයුතු කරන්න.

දීප්ති අබේවික්‍රම

සභාපති.

පිටපත්:

1. සාමාන්‍යාධිකාරි
2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සංවර්ධන /ව්‍යාප්ති)
3. සහකාර සාමාන්‍යාධිකාරි(පරිපාලන/සේවා)
4. අභ්‍යන්තර විගණක
5. කළමනාකරු (මුදල්)
6. කළමනාකරු (ප්‍රජා සංවර්ධන / සැලසුම් හා නියමුකරණ)
7. සියලුම මාණ්ඩලික නිලධාරි
8. සියලුම කාර්යභාර නිලධාරි
9. සියලුම තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරීන්
10. ගරු සභාපති /ගරු ලේකම් - සමස්ත ලංකා සමිති සංවිධානය.